# නව සම සමාජ පක්ෂය
# நவ சம சமாஜ கட்சி
# NAVA SAMA SAMAJA PARTY

4 වන ජාත්‍යන්තරයේ ශාඛාව
4 வது அகிலத்தின் கிளை
Section of the 4th international

17, බැරැක්ක පටුමග, කොළඹ 02. இல.17, பெரக் ஒழுங்கை, கொழும்பு 02. 17, Barrack Lane, Colombo 02.
Tel:. 011 2430621 Fax:011 2305963 email - nssp.lk@gmail.com Web:www.nssp.info


2022.08.03

**<u>පුවත්පත් නිවේදනය - සියළු ජනමාධ්‍ය වෙත</u>**

ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් ජෝසෆ් ස්ටාලින්, අද දින සැදෑවේදී කොළඹ මධ්‍යම අපරාධ විමර්ශන කාර්යාංශය මගින් අත්අඩංගුවට ගෙන තිබේ.

ඉකුත් මැයි 28 වැනිදා කොළඹ බැංකු මාවතේ පැවැති විරෝධතාවයකදී අධිකරණ නියෝග කඩ කළේ යැයි ඔහුට චෝදනා එල්ල කර ඇත.

ජනතා විරෝධතාවයකදී යම් යම් තාක්ෂණික නියෝග ඉක්මවා යෑම් සාමාන්‍ය සිදුවීම් වන අතර, ඒ සෑම විටම පාහේ ඒ හෝ මේ පුද්ගලයන් අත්අඩංගුවට නොගැනීමද සාමාන්‍ය තත්වය වේ.

නමුත් අදාල සිදුවීමට මාස දෙකක පමණ කාලයක් ගතවී තිබියදීත්, මේ ගුරු සංගම් නායකයා අත්අඩංගුවට ගැනීම නම් අසාමාන්‍ය සිදුවීමක් බව අප තරයේ කියා සිටිමු.

ඒ අනුව සිතාමතා, කල්යල් බලා සිට, නව ජනාධිපතිවරයා දේශයට ප්‍රජාතන්ත්‍රවාදය ගෙන ඒමට ශපත කරමින් පාර්ලිමේන්තුවේ නව සැසිවාරය විවෘත කළ දාම, රටේ ප්‍රධාන පෙළේ වෘත්තීය සමිති නායකයකු වන ජෝසෆ් ස්ටාලින් අත්අඩංගුවට ගැනීම, ප්‍රජාතන්ත්‍රවාදයට සිදුකළ බැරෑරුම් නිගාවක් ලෙස අපි සළකමු.

ඒ අනුව වහාම ඔහුව නිදහස් කරන ලෙසත්, දේශපාලන, ආර්ථික හෝ සමාජීය ප්‍රශ්න මුල්කරගත් හේතුමත ආණ්ඩුවට හෝ ඕනෑම ඇහුන්කන්නොදෙන බලධාරීත්වයකට එරෙහිව උද්ඝෝෂණයන්හි යෙදීමට ජනතාවට ඇති අයිතියට හරස්ව යන මෙවැනි පියවරයන් ගැනීම සහමුලින්ම අත්හිටවන ලෙසත් අපි ආණ්ඩුවට බල කර කියා සිටිමු.

**දේශපාලන මණ්ඩලය – නව සම සමාජ පක්ෂය**